## උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## ஊவா மாகாண கல்வித் திணைக்களம்
## UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | ව්‍යවසායකත්ව අධ්‍යයනය - I | කාලය පැය 01යි. |
|---|---|---|

**සැ.යු ඃ (i) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
**(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න**

---

01. ව්‍යවසායකයා යනු,
    1. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ යෙදී සිටින්නාය.
    2. ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයාය.
    3. නිෂ්පාදන සාධක මෙහෙයවන්නාය.
    4. වැටුපට කායික හා මානසික ශ්‍රමය සපයන්නාය.

02. පහත දැක්වෙන්නේ ව්‍යවසායකත්වය හැඳින්වීමට අදාල ප්‍රකාශ කිහිපයකි.
    A - පෞරුෂ ගුණාංගයකි
    B - වටිනා අදහසකි
    C - පුද්ගලයෙකු හා සම්බන්ධ මනෝභාවයකි.
    D - වෙනසක් ඇතිකිරීමට පදනම් වන්නාවූ චින්තනයකි.
    E - දැනුම පමණක් සම්බන්ධවූවකි.

    ඉහත ප්‍රකාශවලින් නිවැරදි වනුයේ.

    1. A B    2. E B    3. D E    4. C D

03. ව්‍යවසායකත්වයට අදාල පහත ප්‍රකාශන අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශන ඛණ්ඩය තෝරන්න,
    1. අවදානම් දරයි/වැටුප් ලබයි    2. නව්‍යතා බිහි කරයි/වැටුප් ලබයි
    3. අවදානම් දරයි/පොළී ලබයි    4. නව්‍යතා බිහි කරයි/ලාභ ලබයි

04. ව්‍යවසායකයකුට තම නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි ක්‍රමයක් නොවන්නේ,
    1. අසාර්ථකත්වය ඉවසීමයි    2. නිර්මාණාත්මක හැසිරීම් ආදේශනය කිරීමයි
    3. ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීමයි    4. කුතුහලය දිරිමත් කිරීමයි

05. භාණ්ඩ හා සේවා යනු මිනිස් අවශ්‍යතා සපුරාලන ඕනෑම දෙයකි. මේ අනුව මිනිස් අවශ්‍යතා සපුරාලන භාණ්ඩවල ලක්ෂණයක් වන්නේ
    1. සමජාතිය බව ආරාක්ෂා වීම    2. අස්පෘශ්‍ය වීම
    3. සපයන්නන්ගෙන් වෙන්කර නොහැකි වීම    4. ගබඩා කළ නොහැකි වීම

06. ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර පවතින සමානතාවයක් දැක්වෙන පිළිතුර නොවන්නේ,
    1. ආර්ථික කටයුත්තක යෙදීම    2. අවධානමකට මුහුණදීම
    3. සම්ප්‍රදානුකුල වීම    4. ගනුදෙනුවල නිරත වීම

07. ප්‍රධාන ව්‍යවසායකයින් වර්ගයක් නොවන්නේ,
    1. ව්‍යාපාර ව්‍යවසායකයෝ    2. සමාජයීය ව්‍යවසායකයෝ
    3. ආයතනික ව්‍යවසායකයෝ    4. සමාජවාදී ව්‍යවසායකයෝ

08. ජෙසිකාකොක් නමැති ගුවන් නියමු වරියගේ සාර්ථකත්වයට අදාල ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ
    1. අනාගත දැක්මයි
    2. පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීමයි
    3. ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බවයි
    4. නව්‍යශීලීත්වයයි

www.edudept.up.gov.lk

**09.** ව්‍යාපාරයක බාහිර පරිසර සාධක පමණක් අඩංගු පිළිතුර වනුයේ,
1. සම්පත්, තාක්ෂණය, සේවකයන්, ප්‍රජාව
2. දේශපාලනය, සමාජ හා සංස්කෘතිය, තාක්ෂණය, ප්‍රජාව
3. කළමනාකරුවන්, සමාජ හා සංස්කෘතිය, තාක්ෂණය, ප්‍රජාව
4. සම්පත්, තාක්ෂණය, කළමනාකරුවන්, සමාජ හා සංස්කෘතිය.

**10.** ව්‍යාපාරය සමස්ථයක් ලෙස සලකා බලමින් අනාගතයේදී ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම,
1. තාක්ෂණික කුසලතා වේ
2. මානව කුසලතා වේ
3. සංකල්පනාත්මක කුසලතා වේ
4. සන්නිවේදන කුසලතා වේ

**11.** අවදානම භාර ගන්නා පුද්ගලයාට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් අත්පත්කරදීමේ හැකියාව ඇති ආකර්ශණීය ආයෝජන අදහසක්
1. ව්‍යාපාර අදහසක් වේ
2. ව්‍යාපාර අවස්ථාවක් වේ
3. ව්‍යාපාරයක් වේ
4. ව්‍යවසායක් වේ

**12.** නිෂ්පාදන නව්‍යකරණයට මග පාදන ආකෘතිය වන්නේ,
1. ශදුඅත විශ්ලේෂණයයි
2. සූක්ෂම විශ්ලේෂණයයි
3. ස්කැම්පර් ආකෘතියයි
4. සාර්ව විශ්ලේෂණයයි

**13.** යම් පුද්ගලයෙකුගේ නව සොයා ගැනීමක් වෙනුවෙන් එහි අයිතිය ලබාදෙන රජයේ සහතිකය වන්නේ
1. ලියාපදිංචි සහතිකයයි
2. පේටන්ට් බලපත්‍රයයි
3. වෙළෙඳ සහතිකයයි
4. ව්‍යාපාර ආරම්භ කිරීමේ සහතිකයයි

14. රවිඳු තම ව්‍යාපාරය පිළිබඳව නාමල්ට පැවසූ වදනක් පහත දැක්වේ.

"ව්‍යාපාරය මේ තත්වයට ගේන්න මම බොහෝම මහන්සි වෙච්ච පුද්ගලයෙක් " මෙම ප්‍රකාශනයෙන් ඔහු අදහස් කරනු ලැබුවේ,

1. ව්‍යාපාරය පිළිබඳව ධනාත්මකව සිතන බවයි
2. ව්‍යාපාරයෙන් ලැබූ අත්දැකීම් ඉතා වැදගත්වන බවයි
3. ව්‍යාපාරයේ වර්ථමාන තත්වය පිළිබඳව සෑහීමකට පත්වන බවයි
4. ව්‍යාපාරය වෙනුවෙන් කළ කැපවීම හා දැඩි අධිෂ්ඨානය පිළිබඳවයි

**15.** නිමල්ගේ ව්‍යාපාරය පිළිබඳව පහත ප්‍රකාශන ඔබට දී ඇත,

A - සේවකයින්ගේ රාජකාරියට වාර්ථා කිරීම අවිධිමත්ය.
B- ගනුදෙනුකරුවන් ව්‍යාපාරයට නැවත නැවත පැමිණේ.
C- ගුණාත්මක භාණ්ඩ සාධාරණ මිලකට සැපයීමේ හැකියාව ව්‍යාපාරයට ලැබී තිබේ.
D - කළමණාකරු උපරිම මානව හිතවාදීව කටයුතු කරයි.

ඉහත කරුණු අතුරින් නිමල්ගේ ව්‍යාපාරයේ ශක්තීන් හා දූර්වලතා වනුයේ,

| පිළිතුරු අංක / අයිතමය | 1. | 2. | 3. | 4. |
|---|---|---|---|---|
| ශක්තීන් | A හා B | B හා C | B හා C | A හා B |
| දූර්වලතා | A | A | D | D |

**16.** ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන නිශ්පාදන අංශ වනුයේ,
1. සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ, මහා පරිමාණ අංශයන්ය.
2. රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ය.
3. දේශිය හා ජාත්‍යන්තර අංශයන්ය.
4. ප්‍රාථමික, ද්විතියික, තෘතියික අංශයන්ය.

www.edudept.up.gov.lk

17. අභ්‍යවකාශ සංචාරක සේවාවක් ඇරඹීම සඳහා සුදුසුතම වෙළඳපලට ප්‍රවේශවීමේ ක්‍රමය වනුයේ,
   1. පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීමය.
   2. නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීමය.
   3. නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීමය.
   4. පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීමය.

18. ශ්‍රී ලංකාවේ සුලභ සම්පත් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි ඒවා නම්,
   1. භෞතික සම්පත් / මානව සම්පත්
   2. ස්වභාවික සම්පත් / ඛනිජ සම්පත්.
   3. මානව සම්පත් / මානව නොවන සම්පත්
   4. මානව සම්පත් / ස්වභාවික සම්පත්

19. යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේදී අනුගමනය කළයුතු පියවර නිවැරදිව දැක්වෙනුයේ,
   1. SCAMPER ආකෘතිය / සූක්ෂම විශ්ලේෂණය / සාර්ව විශ්ලේෂණය
   2. සූක්ෂම විශ්ලේෂණය / සාර්ව විශ්ලේෂණය / ශදුඅත විශ්ලේෂණය
   3. ශදුඅත විශ්ලේෂණය / සාර්ව විශ්ලේෂණය / SCAMPERආකෘතිය
   4. SCAMPER ආකෘතිය / ශදුඅත විශ්ලේෂණය / සූක්ෂම විශ්ලේෂණය

20. සමාජයේ ප්‍රශ්න වලට නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කරනුයේ
   1. සමාජීය ව්‍යවසායකයා ය.
   2. ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවසායකයා ය.
   3. නවෝත්පාද නව්‍ය ව්‍යවසායකයා ය.
   4. නිර්මාණශීලී ව්‍යවසායකයා ය.

21. ව්‍යාපාර අදහස පැහැදිලි කිරීමට, ව්‍යාපාරය සඳහා මග පෙන්වීමට, ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්වා දීමට යනාදිය සඳහා
   1. ව්‍යාපාරයට සංවිධාන ව්‍යුහයක් අවශ්‍යවේ.
   2. ව්‍යාපාරයට ව්‍යාපාර සැලැස්මක් අවශ්‍යවේ.
   3. ව්‍යාපාරයට අරමුණු හා පරමාර්ථ පිහිටුවීම අවශ්‍යවේ.
   4. ව්‍යාපාරයට ඉලක්ක හා උපාය මාර්ග අවශ්‍යවේ.

22. සමස්ථ ව්‍යාපාර සැලැස්ම පිළිබඳ අවබෝධකර ගැනීමට ඉවහල් වනුයේ,
   1. විධායක සාරාංශයයි.
   2. අලෙවි සැලැස්මයි.
   3. මූල්‍ය සැලැස්මයි.
   4. පරිපාලන සැලැස්මයි.

23. ආයතනයේ විවිධ පාර්ශව අතර තොරතුරු බෙදාහැරීමට, තොරතුරු රැස්කර ගැනීමට, මෙන්ම ඒවා ක්‍රමානුකූලව වාර්තා කිරීමට ව්‍යවසායකයෙකු සතු හැකියාව
   1. සන්නිවේදන කුසලතාව වේ.
   2. මානව කුසලතාව වේ.
   3. තාක්ෂණික කුසලතාව වේ.
   4. සංකල්පනාත්මක කුසලතාව වේ.

24. පාසල් බෑග් සඳහා ඉලක්ක පාරිභෝගිකයින් වන්නේ,
   1. කුඩා දරුවන්.
   2. පාසල් යන ළමුන්.
   3. සම වයස් වල යහළු යෙහෙලියන්
   4. දෙමාපියන්.

25. වෙළඳපොළට ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවාවලට ඉල්ලුමක් ඇතිකර ගැනීමටද, පවතින ඉල්ලුම වැඩිකර ගැනීමටද, ඉලක්ක පාරිභෝගිකයා ආකර්ශණය කර ගැනීමටද භාවිතා කරන උපක්‍රම අයත්වන අලෙවි කරණ මිශ්‍රය වනුයේ,
   1. නිෂ්පාදිත මිශ්‍රයයි
   2. පිරිවැය මිශ්‍රයයි
   3. ප්‍රවර්ධන මිශ්‍රයයි
   4. ස්ථාන මිශ්‍රයයි

26. ඉදිරි නිශ්චිත කාලයකදී ව්‍යවසායකයා වෙළඳපළට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා ප්‍රමාණය තීරණය කිරීම
   1. විකුණුම් පුරෝකථනයයි.
   2. අලෙවි දැක්මයි.
   3. විකුණුම් ඉලක්කයයි.
   4. වෙළඳපොල හිඩැසයි.

27. නිෂ්පාදන සැලැස්මේ ඇතුලත් ප්‍රධාන තොරතුරක් නොවන්නේ
   1. නිෂ්පාදන ක්‍රියාවලිය
   2. නිෂ්පාදන ස්ථාවර වත්කම්
   3. නිෂ්පාදන පිරිවැය
   4. නිෂ්පාදන පුරෝකථනය

www.edudept.up.gov.lk

28. | ………………… | = | ද්‍රව්‍ය පිරිවැය | + | ශ්‍රම පිරිවැය | + | වෙනත් පිරිවැය |

හිස්තැනට අදාළවනුයේ,

1. වක්‍ර පිරිවැය 2. ඍජු පිරිවැය 3. නිෂ්පාදන පිරිවැය 4. යන්ත්‍ර පිරිවැය

29. මුළු නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව නිෂ්පාදන ඒකක පිරිවැයෙන් වැඩි කළවිට,
1. විකුණුම් මිල ලැබේ
2. නිෂ්පාදන පිරිවැය ලැබේ
3. නිෂ්පාදන වියදම ලැබේ
4. ලාභය සොයා ගත හැකිය

30. අවශ්‍යවේ යැයි අපේක්ෂා කරන මානව සම්පත් පිළිබඳ ව තොරතුරු හා පිරිවැය ඇස්තමේන්තු ඇතුළත් කොට සැකසෙනුයේ,
1. නිෂ්පාදන සැලැස්මයි
2. සංවිධාන ව්‍යුහයයි
3. පරිපාලන සැලැස්මයි
4. පරිපාලන ව්‍යුහයයි

31. ව්‍යාපාර ආයතනයක සංවිධාන සටහන මගින්,
1. තනතුරුවල ස්වභාවය දැක්වේ.
2. ආයතන සැකැස්ම දැක්වේ.
3. තනතුරට අදාල සුදුසුකම් දැක්වේ.
4. තනතුරු පිහිටුවා ඇති ආකාරය දැක්වේ.

32. පරිපාලන වියදමක් නොවන්නේ,
1. අමුද්‍රව්‍ය පිරිවැය.
2. රක්ෂණ ගාස්තු.
3. දුරකථන වියදම්.
4. කළමනාකරුගේ වේතනය

33. මුළු ආයෝජන ඇස්තමේන්තුවක ඇතුළත් ප්‍රධාන ආයෝජන කාණ්ඩ තුළට අයත්වන්නේ,
1. බැංකු ණය
2. ස්ථාවර වත්කම් වල වටිනාකම
3. වෙළඳපල සමීක්ෂණ වියදම්.
4. ලාභය

34. නිශ්චිත කාලච්ඡේදයක් තුළ ව්‍යාපාරයේ මුදල් ගලා ඒම් හා මුදල් ගලා යෑම් දැක්වෙනුයේ,
1. මුදල් ශේෂයෙහි ය
2. බැංකු පොතෙහි ය
3. ආදායම් ප්‍රකාශයෙහි ය
4. මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ය

35. ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,
1. ආර්ථික කටයුත්තක නියැලීම
2. සාමූහික සම්බන්ධතාවක් පැවතීම.
3. ලාභ ලැබීම.
4. කළමනාකරුවන් සිටීම.

36. පහත සඳහන් සංවිධාන අතරින් ව්‍යාපාර සංවිධාන වර්ගයක් වන්නේ,
1. රතුකුරුස සංවිධානය
2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
3. වරලත් ව්‍යාපාර
4. රාජ්‍ය නොවන සංවිධාන

37. හවුල් ව්‍යාපාර සම්බන්ධ සාවද්‍ය කරුණ වන්නේ ,
1. පැවැත්ම අඛණ්ඩ වීම
2. නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
3. ලියාපදිංචිය අනිවාර්ය නොවීම
4. හවුල්කරුවන් සංඛ්‍යාව 2-20 අතර සංඛ්‍යාවක් වීම

38. ව්‍යවසායකත්වයට එරෙහිවන සමාජයීය සාධකයක් නොවන්නේ,
1. ස්ථාවර දේශපාලන තත්ත්වය.
2. ආදර්ශ චරිත.
3. සම්පත් ලබා ගැනීමේ හැකියාව.
4. ඉහත සියල්ලම.

39. ව්‍යාපාර ආචාර ධර්ම තීරණය කිරීම සඳහා අදාල නොවන පාර්ශවය කුමක්ද ?
1. ප්‍රවර්ථකයන්ය.
2. බාහිර සමාජයය.
3. පාරිභෝගිකයන්ය.
4. ආයතනයේ සාමාජිකයන්ය.

40. ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම මුල්කර ගනිමින්ම ආරම්භ කළ බලපත්‍ර ලාභී විශේෂිත බැංකුව වනුයේ,
1. SMED බැංකුව
2. මහජන බැංකුව
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. DFCC බැංකුව



www.edudept.up.gov.lk